## කාලය

පාඨමාලාවේ කාලය මාස 12 කි. සෑම සෙනසුරාදා දිනකම පෙ.ව. 8.00 සිට ප.ව 5.00 දක්වා පාඨමාලාවේ දේශන පැවැත්වේ. දිනකට දේශන පැය ගණන පැය 08 කි. මීට අමතරව ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු හා පැවරුම් සම්පූර්ණ කළ යුතුය.

## ඉගෙනුම හා ඉගැන්වීමේ ක්‍රමය :

I. පංති කාමර අධ්‍යයන
II. අභ්‍යාස, භූමිකා රංගන
III. ශ්‍රව්‍ය / දෘශ්‍ය ඉදිරිපත් කිරීම්
IV. පැවරුම් හා නිබන්ධන
V. ප්‍රායෝගික අභ්‍යාස හා පුහුණුවීම්
VI. ක්ෂේත්‍රීය කටයුතු පුහුණුව
VII. අවසන් ලිඛිත පරීක්ෂණය

## අයදුම්පත් ලබා ගැනීම

අයදුම් පත්‍රය හා අදාල විස්තර පත්‍රිකාව, රු.500.00 ක මුදලක් ඕනෑම මහජන බැංකු ශාඛාවකින් අංක 032100112477594 දරණ ගිණුමට බැර කර ලබාගත් රිසිට් පත සමග සම්බන්ධීකාරක, මනෝවිද්‍යාත්මක උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව, සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර යන ලිපිනයට මුද්දර ගැසූ ලියුම් කවරයක් එවීමෙන් හෝ අධ්‍යයනාංශයට පැමිණ ලබාගත හැකිය.



ලියුම් කවරයේ වම්පස ඉහළ "මනෝවිද්‍යාත්මක උපදේශන පාඨමාලාව" යනුවෙන් සඳහන් කරන්න.

අයදුම්පත් 2017.11.09 වන දින දක්වා නිකුත් කරනු ලැබේ.

## ඩිප්ලෝමා ප්‍රදානය:

පහත සඳහන් අවශ්‍යතා සපුරාලන ලද ශිෂ්‍ය/ශිෂ්‍යාවන් මනෝවිද්‍යාත්මක උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා සහතික පත්‍රය ලැබීමට සුදුසුකම් ලබති.

1. සියළුම පංති කාමර දේශන සහ ක්ෂේත්‍ර පැවරුම් හා අභ්‍යාස වලට සහභාගීවීම හා 80% ක පැමිණීම සම්පූර්ණ කර තිබීම.

2. සෑම ලිඛිත පැවරුමකටම අවම වශයෙන් 20% ක ලකුණු ලබා තිබීම.

3. අවසාන ලිඛිත පරීක්ෂණයෙන් සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම අවම වශයෙන් 40% ක සාමාන්‍යයක් ලැබීම



# මනෝවිද්‍යාත්මක උපදේශනය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව - 2017

# One Year Diploma Course in Psychological Counseling - 2017

සමාජවිද්‍යා අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය
මාතර

දුරකථන අංකය 041 - 3490621
**E-mail: sociology@hss.ruh.ac.lk**

## හැඳින්වීම

මනෝවිද්‍යාත්මක උපදේශනය යනු යම් ගැටලුවකට මැදිහත් වී ඇති පුද්ගලයකුට ඔහු සතු ශක්තීන් තුළින්ම ගැටලුවෙන් මිදීමේ හැකියාව ලබා දෙන යාන්ත්‍රණයකි. ඇතැම් විට මෙය පුද්ගල හෝ සමාජ ප්‍රශ්නයක් විය හැකිය. බොහෝ විද්වතුන් සඳහන් කරන පරිදි පුද්ගලයන්ට විවිධ අවස්ථාවල දී මුහුණ දීමට සිදුවන ජීවන ගැටලු, පරාජයන් හා පීඩන හමුවේ නොසැලී සිටීමට හා ඒවාට විසඳුම් සපයා ගැනීමට උපදේශනය සාර්ථකව ප්‍රයෝජනවත් වී තිබේ. උපදේශනය වනාහී පුද්ගලයන් ගැටලුවලට මැදිහත් වීමේ දී පමණක් උපකාරී වන්නක් නොවේ. පුද්ගලයන් තුළ සැඟවී ඇති දක්ෂතා වර්ධනය කර ගැනීමට, තමාගේ අනාගත ගමන් මාර්ගය සැලසුම් කර ගැනීමට, අතීත හා වර්තමාන ගැටලු තුළින් අනාගත අපේක්ෂා වර්ධනය කර ගැනීමට ද උපදේශනය මහෝපකාරී වේ. තමා තුළින් ම තමාව හඳුනා ගැනීම කෙරෙහි මනෝවිද්‍යාත්මක උපදේශනය ප්‍රබල හේතුකාරකයක් වී ඇත. මේ අනුව මනෝවිද්‍යාත්මක උපදේශනය යනු ඒ හා සම්බන්ධ අධ්‍යාපනය ලබා දීමක් පමණක් නොවේ.



එය පුද්ගල ගැටලු විසඳීමට හා පුද්ගල පෞරුෂය වර්ධනය කිරීමට උපකාර වන සාර්ථක මැදිහත් වීමකි. එබැවින් සාර්ථක උපදේශන මැදිහත්කරුවෙක් සතුව එම විෂය සම්බන්ධව මනා දැනීමක් හා පුහුණුවක් පැවතීම වැදගත් වේ.

මෙම අවශ්‍යතාවයන් සපුරාගැනීම අරමුණු කර ගනිමින් රුහුණ විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා අධ්‍යයනාංශය මගින් මනෝවිද්‍යාත්මක උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සංවිධානය කරනු ලබයි.

## ඉලක්කගත කණ්ඩායම්

සමාජ සුබසාධන ප්‍රජා සංවර්ධන, ආරක්ෂක, සෞඛ්‍ය, ගුරු වෘත්තියේ හා උපදේශන ක්ෂේත්‍රයේ රැකියාවක නිරතවුවන්ට හා එම ක්ෂේත්‍රයෙහි රැකියා අපේක්ෂා කරන්නන්ට, උපදේශනය පිළිබඳ වැඩිදුර අධ්‍යාපනය ලැබීමට අපේක්ෂා කරන්නන්ට.

## ඇතුලත්වීමේ සුදුසුකම්

එක් වරක දී අවම වශයෙන් විෂයන් 03 ක් සහිතව අ.පො.ස. උසස් පෙළ සමත්වීම

**හෝ**

පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් උසස් සහතිකපත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම හා විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන අභියෝග්‍යතා පරීක්ෂණයකින් සමත් වීම.



**හෝ**

රුහුණ විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් පිළිගනු ලබන අ.පො.ස. උසස් පෙළ විභාගයට සමාන විභාගයකින් සමත් වී තිබීම.

## පාඨමාලා ගාස්තු:

| | |
|---|---|
| පාඨමාලා ගාස්තුව | රු50000.00 |
| ලියාපදිංචිවීමේ ගාස්තුව | රු.2500.00 |
| විභාග ගාස්තුව | රු.2200.00 |
| ශිෂ්‍ය හැඳුනුම්පත් ගාස්තුව | රු.300.00 |
| **සම්පූර්ණ ගාස්තු** | **රු55000.00** |

## සම්මුඛ පරීක්ෂණය හා ලියාපදිංචිය

අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරාගනු ලැබේ. තෝරාගත් අයදුම්කරුවන් ලියාපදිංචි වීමේදී පාඨමාලා ගාස්තුවෙන් රු30000.00 ක් ගෙවිය යුතු අතර ඉතිරිය පාඨමාලාව ආරම්භ වී මාස තුනක් ඇතුළත ගෙවීම අනිවාර්ය වේ.